SC

16 MAR 2010
UNIVERSITY OF KELANIYA

# නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑමට සිදුවන ගැටලු

(බේරුවල නගර සංවර්ධන සැලැස්ම ඇසුරින්)

එච්.ඩබ්ලිව්.අයි.එච්. විතාරණ FGS\G\2001\447\R

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ භූගෝල විද්‍යාව පිළිබඳ සමාජ විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 598 |
| වර්ග අංකය | |



2008 ජුලි

# සාරාංශය


සීඝ්‍රයෙන් අවිධිමත් නාගරීකරණය කරා එළැඹෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ බොහෝ නගර වර්ධනය වී ඇත්තේ නිසි සැලැස්මකට අනුව නොවේ. මේ නිසා අවිධිමත් නාගරීකරණය හමුවේ ලංකාවේ නගර ඇසුරින් නාගරික ගැටලු රැසක් ජනිත වී පවතී. මෙම ගැටලු උග්‍රවත්ම නාගරික ජනජීවිතය අඩාල වීමට පටන් ගෙන ඇත. මෙම ගැටලු යම් තරමකට හෝ අවම කර නගරය කාර්යක්ෂමව හා ප්‍රශස්ත ඉඩම් භාවිතයකට ගෙන එමින් නගර වැසියාගේ ජීවන රටාව සුඛිත මුදිත කරවීම සඳහා විධිමත් නගර සැලසුම් වල අවශ්‍යතාවය ලංකාවේ නගර ඇසුරින් වර්තමානයේ නැතිවම බැරි අංගයක් බවට පත්වී ඇත.

ශ්‍රී ලංකාවේ නගර සංවර්ධන සැලසුම් සඳහා අනාදිමත් ඉතිහාසයක් පැවතුනද තාර්කික ප්‍රවේශයක් මත නිසි සැලසුම්කරණයට ප්‍රවේශ වී ඇත්තේ 19 වන සියවසේ මැද භාගයේ සිටයි. ක්‍රමානුකූල නගර සංවර්ධනය සඳහාම බිහිවූ ව්‍යවස්ථා සම්පාදන රැසක්ම ලංකාවේ නගර ඇසුරින් අතීතයේ සිටම දක්නට ලැබිණි.

මෙම ව්‍යවස්ථා සම්පාදන අතුරින් වර්ථමානයේ නගර සංවර්ධන සැලසුම් පිලියෙල කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ආධිපත්‍යය නාගරික සංවර්ධන අධිකාරියට හිමි වී ඇත. 1978 වර්ෂයේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය මගින් මේ දක්වා ලංකාවේ නගර 225 ක්ම නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කොට නාගරික සංවර්ධන අධිකාරියේ නිති රෙගුලාසි ප්‍රකාරව නාගරික සංවර්ධන සැලසුම් පිලියෙල කරගෙන යමින් පවතී.

1978 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරියේ ස්ථාපනය කර නගර 225ක් ප්‍රකාශිත බල ප්‍රදේශ ලෙස නම්කළද නගර සංවර්ධන සැලසුම් නීතිගත කර ඇත්තේ 33ක් වැනි ඉතා අඩු සංඛ්‍යාවකි. දශක තුනකට අධික කාලයක් ගත වුවද නගර සංවර්ධන සැලසුම් පිලියෙල කිරීම මෙතරම් අඩු අගයක් ගැනීමට හේතු සොයා බැලීම කල යුතුම වේ.

මෙහිදී සිදු වනු ලබන්නේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත බල ප්‍රදේශ සියල්ලටම පාහේ නගර සංවර්ධන සැලසුම් පිළියෙල කලද එය ගැසට් නිවේදන මගින් නීත්‍යානුකූල තත්වයට පත් කිරීමේදී සිදුවනු ලබන පසුබෑම මෙයට ප්‍රබලම හේතුන් වී ඇත. යෝජිත අධ්‍යයනය තුලින් විමසීමක් සිදු කර ඇත්තේ මෙසේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් පිළියෙල කරනලද නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටලු සහ එම ගැටලු හේතුවෙන් නගර සංවර්ධන සැලසුම් අඩාල වන ආකාරයයි.

මෙම තත්වය බස්නාහිර පළාතේ නගර ඇසුරින් බහුලව දක්නට ඇති අතර බස්නාහිර පළාත තුල කලුතර දිස්ත්‍රික්කයේ වඩාත් මෙම ගැටලු කැපී පෙනේ. කලුතර දිස්ත්‍රික්කය තුල පිහිටි බේරුවල නාගරික බල ප්‍රදේශය මුහුදු බඩ පිහිටීමත් ඇති නගරයක් සේම සුනාමි ස්වභාවික ව්‍යවසනය හේතුවෙන් විනාශයට පත්වූ නගරයක් වීමක් අවිධිමත් නාගරික ගැටලු බහුලව දක්නට ලැබීමත් යන කරුණු හේතුකොට ගෙන අධ්‍යයනය සඳහා මා පෙළඹෙන ලදී.

මෙම අධ්‍යයනය පෙළ ගැස්සවීමේදී ලෝකයේ නාගරීකරණය සහ අවිධිමත් නාගරිකරණය ඒ ආශ්‍රිත ගැටලු, නගර සංවර්ධන සැලසුම්වල ඉතිහාසය, එමෙන්ම ඒ සඳහා ඇති ව්‍යවස්ථා සම්පාදනය, නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටලු, බේරුවල නගරය සඳහා සකස් කර ඇති නගර සංවර්ධන සැලසුම සහ අධ්‍යනය සම්බන්ධයෙන් සිදු කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂනය ඇසුරින් සිදු කරන ලද දත්ත විශ්ලේෂණය සහ ඒ ඇසුරින් එළැඹුණු නිගමන සහ යෝජනා ඉදිරිපත් කිරීම මගින් මෙම අධ්‍යයනය ගොනු කර ඇත. අධ්‍යයනයේදී එහි කාලෝචිත බවට හා වැදගත් බවට අවධානය යොමු කිරීමක් සිදුකර ඇත.